


102. ලන්ඩන් ස්කූල් ඔෆ් ඉකොනොමික්ස් විශ්ව විද්‍යාලයේ හුන්ස්ටන් විදියේ ඇතුල්වීමේ දොරටුවේ මානක චිත්‍රය - මෙම ගොඩනැගිල්ල 1922 දී ඉදිකිරීම් අවසන් වූ අතර දැන් හැඳින්වෙන්නේ '' ප්‍රධාන '' නොඑසේනම් ''පැරණි ගොඩනැගිල්ල'' ලෙසය.

# එන්. යූ. ගේ
# ලන්ඩන් ස්කූල් ඔෆ් ඉකොනොමික්ස් විශ්ව විද්‍යාල දිවිය

1938 වර්ෂය එන්. යූ. ගේ ජීවිතයේ තවත් එක් තීරණාත්මක මංසන්ධියකි. ලන්ඩන් ස්කූල් ඔෆ් ඉකොනොමික්ස් විශ්ව විද්‍යාලයේ අභ්‍යන්තර ශිෂ්‍යයෙකු වශයෙන් පශ්චාත් උපාධි පාඨමාලාවක් හැදෑරීම සඳහා ශිෂ්‍යත්වයක් සමඟ වසරක රාජකාරි නිවාඩු ඔහුට ලැබිණ. නව වාණිජ සහ කර්මාන්ත දෙපාර්තමේන්තුවක් පිහිටුවීමේ මූලික කටයුතු රජය විසින් මේ වන විට අරඹා තිබුණි. එන්. යූ. ට ලබාදුන් ශිෂ්‍යත්ව මේ හා සබැඳුනක් විය. විශ්ව විද්‍යාලයේ එක් අවුරුදු පාඨමාලාවක් වූ ''ව්‍යාපාර පරිපාලන'' හැදෑරීම තුළින්, සිය කණිෂ්ඨ නිලධාරියා ''නව දෙපාර්තමේන්තුව'' ට වඩාත් ප්‍රයෝජනවත් පුද්ගලයෙකු බවට පත්වනු ඇතැයි එන්. යූ. ගේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ අදහස විය. පාඨමාලාව අතරතුර ''නවීන ව්‍යාපාර ක්‍රමවේදයන් හොඳින් අවබෝධ කරගනිමින් ප්‍රායෝගික වාණිජ්‍ය ක්ෂේත්‍රයෙහි මනා පුහුණුවක් ඇති කර ගැනීමට කටයුතු කිරීම වැදගත් බව ''ශිෂ්‍යත්වය ආරම්භයේදී ඔහුට උපදෙස් ලබා දී තිබිණ. (එන්. යූ. ජයවර්ධනගේ පෞද්ගලික ලිපිගොනු 1938) ''ප්‍රාථමික කෘෂිකාර්මික නිෂ්පාදන සඳහා වන විදේශීය වෙළඳපොල පිළිබඳව අවබෝධයක් ලබා ගැනීම'' කෙරෙහි තමා තුළ උනන්දුවක් ඇතැයි විශ්ව විද්‍යාලයට ඉදිරිපත් කල අයදුම්පතෙහි එන්. යූ. විසින් සඳහන් කර තිබිණි. එමෙන්ම තමාට අලෙවි සමීක්ෂණ කටයුතු පිළිබඳව අවබෝධයක් ලබා ගැනීම පිණිස මෑතකදී පිහිටවනු ලැබූ ''යටත් විජිත අධිරාජ්‍යයේ අලෙවි මණ්ඩලය'' සමඟ ශ්‍රී ලංකා රජයේ වැඩ පිළිවෙලක් යොදාගනු ඇතැයි ද එන්. යූ. මෙහිදී පළ කළේය. ඔහුගේ ප්‍රධානතම උනන්දුව වූයේ කොප්පරා (oil seeds) අලෙවි කිරීමය. මේ කාලය වන විට කොප්පරා සහ පොල්තෙල් අපනයනයේ ප්‍රමුඛයා බවට පත්ව තිබීම මීට තුඩුදුන් හේතුවයි. (මහාචාර්ය පීටර් අගෝල්ඩ් ට යැවූ ලිපිය - 1938 ජනවාරි 18).



103. විශ්ව විද්‍යාලයේ පන්ති කාමරයක්

ලන්ඩන් ස්කූල් ඔෆ් ඉකොනොමික්ස් විශ්ව විද්‍යාලයේ වාර්තා වලට අනුව එන්. යූ. ට ලැබුණු ශිෂ්‍යත්වයේ වටිනාකම ස්ටර්ලින් පවුම් 300 කි. ඊට අමතරව වැටුපින් අඩකට සමාන දීමනාවක් ද ගෙවනු ලැබිණ. පාඨමාලාවට වැයවූ මුදල ස්ටර්ලින් පවුම් 300 ක් වූ අතර, වර්ෂයක් නිවාඩු වක් ද ලබා දී තිබිණි.

තම අධ්‍යාපන කටයුතු තවත් වර්ෂයකින් දීර්ඝ කරන ලෙස එන්. යූ. ඉල්ලීමක් ඉදිරිපත් කළේය. විශ්ව විද්‍යාලයේ අවසරය

ලැබෙන්නේ නම් ආචාර්ය උපාධියක් ද මේ දෙවසර තුළ නිම කිරීම ඔහු තුළ වූ අපේක්ෂාවයි. ඉහළ ඉලක්කයන් කරා ලඟා වීම සාමාන්‍ය චරිත ලක්ෂණයක් කොටගත් එන්. යූ. ගේ මෙම අරමුණ කිසිසේත්ම අසාමාන්‍ය වූවක් නොවීය. කෙසේ වුවද විශ්ව විද්‍යාලය අනුගමනය කළ දැඩි නීති රීති තිබිණි. ඔහුට උපදෙස් ලැබුනේ ''ව්‍යාපාර පරිපාලන'' පාඨමාලාවට සමගාමීවම විද්‍යාපති (M.Sc.) උපාධියක් හැදෑරීම පිණිස ඉල්ලුම් කරන ලෙසය. එම අභියෝගය ඔහු එලෙසින්ම භාරගත්තේය. මේ සියල්ල අතරතුර ද, නීති උපාධියක් ලබා ගැනීමේ අභිලාෂය ඔහු තුළින් බැහැර වී නොතිබිණි. දෙවන පාඨමාලාවට අවසර ලැබුණු වහාම ලන්ඩන් නීති උපාධිය හැදෑරීම සඳහා ලියා පදිංචි වීමේ සහ අධ්‍යන කටයුතු කිරීමේ අවසරය විශ්ව විද්‍යාලයෙන් ඉල්ලුම් කල එන්. යූ. ට ඒ සඳහා ද අවසර ලැබිණ.

ලන්ඩන් ස්කූල් ඔෆ් ඉකොනොමික්ස් විශ්ව විද්‍යාලයේ විශේෂ ව්‍යාපාර පරිපාලන පාඨමාලාව හැදෑරීමට අවස්ථාව ලැබීම අහඹු සිද්ධියකි. එසේ වුව ද සිය ජීවිතයේ දෙවන භාගයේ දී ව්‍යාපාර සහ මූල්‍ය ක්ෂේත්‍රයේ දැවැන්තයෙකු වශයෙන් කටයුතු කිරීමට අවශ්‍ය න්‍යායානුකූල හා ප්‍රායෝගික දැනුම ද එහිදී ලබාගත් වාණිජ හා ව්‍යාපාර අධ්‍යයන කටයුතු තුළින් ඔහු වෙත ලැබිණ. අභ්‍යන්තර ශිෂ්‍යයෙකු වශයෙන් කටයුතු කිරීම නිසා පවුල් වගකීම් වලින් මෙන්ම රාජකාරි කටයුතු වලින් නිදහස්ව, ඉගෙනීමට පමණක් හිත යෙදවීමට එන්. යූ. ට හැකිවිය. විශිෂ්ඨ ආර්ථික විද්‍යාඥයින්ගෙන් සහ සමාජ විද්‍යාඥයින්ගෙන් විෂය දැනුම උකහා ගැනීමේ භාග්‍ය ද ඔහුට හිමි විය. මොවුන් සමහරෙකු විසින් රචනා කරන ලද කෘති සහ ආර්ථික විද්‍යා උපාධිය හැදෑරීම අතරතුර එන්. යූ. විසින් පරිශීලනය කොට තිබිණ. ලෝකයේ වාණිජ මධ්‍යස්ථානයක් මෙන් උගතුන්ගෙන් පිරී පැවතුන ලන්ඩන් නගරයේ වෙසෙමින් උසස් ගණයේ විශ්ව විද්‍යාලයක අධ්‍යාපනය ලැබීම ඔහුගේ ජීවිතයට උදාවූ විශිෂ්ඨ අවස්ථ ාවක් විය. 1938 සැප්තැම්බර් මාසයේ එන්. යූ. එංගලන්තයට ලඟා වූ අතර ඔහුගේ ප්‍රථම අධ්‍යයන වාරය එම වර්ෂයේ ඔක්තෝම්බර් මාසයේ ඇරඹී 1939 ජුනි මාසයෙන් නිම වීමට නියමිතව තිබිණ. ඒ වන විට ද උපාධිධාරියෙකුව සිටිය ද ලන්ඩන් ස්කූල් හි ජීවිතය ඔහුගේ ප්‍රථම පූර්ණ කාලීන අධ්‍යාපන අත්දැකීමයි. බුද්ධිමතෙකු වශයෙන් කැපී පෙනීමට මෙන්ම වෘත්තීය ජීවිතයේ ඔහු අත්පත් කරගත් විශිෂ්ඨ භාවය ද ලන්ඩන් නුවර ගතකළ කාල පරිච්ඡේදය එන්. යූ. ඉමහත් සේ බලපෑ බව පැහැදිලිය.

ශ්‍රී ලංකා ආණ්ඩුව මේ වන විට තම වාණිජ දෙපාර්තමේන්තුවක් ඇති කිරීම කාර්යයෙහි යෙදී සිටි බව මෙහි මුලින් සඳහන් කෙරිණ. මෙම ප්‍රශ්නයෙහි එක් අදියරක් වශයෙන් විදේශ රටවල ''වෙළඳ කොමිසම'' පිහිටුවා තිබිණ. ලන්ඩන් නුවර ''වෙළඳ කොමිසම'' පිහිටුවා තිබුණේ කොක්ස්පර් වීදියේ අංක 28 දරණ ස්ථානයේ පිහිටි සිලෝන් හවුස් නමින් හැඳින්වුනු ගොඩනැගිල්ලකය. එන්. යූ. ගේ තැපැල් ලිපිනය වූයේ ද සිලෝන් හවුස් ගොඩනැගිල්ලයි.



104. ෆේබියන් සමාජයේ (අධ්‍යාපන වෘත්තිකයන්ගේ) - නිල ලාංඡනය





Sidney has been planning to persuade the other trustees to devote the greater part of the money to encouraging Research and Economic study. His vision is to found, slowly and quietly, a "London School of Economics and Political Science" - a centre not only of lectures on special subjects but an association of students who would be directed and supported in doing original work. Last evening we sat by the fire and jotted down a whole list of subjects which want elucidating - issues of fact which need clearing up. Above all, we want the ordinary citizen to feel that reforming Society is no light matter and must be undertaken by Experts specially trained for the purpose.

ඉහල ඃ 105. ලන්ඩන් ස්කූල් ඔෆ් ඉකොනොමික්ස් විශ්ව විද්‍යාලයේ සම - සමාරම්භකයන් වන සිඩ්නි සහ බියට්‍රිස් වෙබ්
පහල ඃ 106. බියට්‍රිස් වෙබ් ගේ යතුරු ලියනය කරන ලද දිනපොතේ උපුටනයක්, 21 සැප්තැම්බර් 1894

**ලන්ඩන් ස්කූල් ඔෆ් ඉකොනොමික්ස් විශ්ව විද්‍යාලය :**

''ලන්ඩන් ආර්ථික විද්‍යා සහ දේශපාලන විද්‍යා පාසල'' ප්‍රසිද්ධියට පත්ව තිබුණේ LSE වශයෙනි. ආයතනය ලන්ඩන් විශ්ව විද්‍යාලයේ ම කොටසක් විය. නොට්බෙලි සිඩ්නි, බියට්‍රිස් වෙබ්, ග්‍රැහැම් වොලස් සහ ජෝර්ජ් බර්නාඩ් ෂෝ යන වියතුන් ගේ ප්‍රධානත්වයෙන් යුත් ෆේබියන් සමාජවාදී කණ්ඩායමක් විසින් 1995 දී ලන්ඩන් ස්කූල් ඔෆ් ඉකොනොමික්ස් ආයතනය ස්ථාපනය කෙරිණි.

ආයතනය පිහිටුවන අවස්ථාව වන විට ද දිගු ඉතිහාසයක් හිමිව තිබූ ඔක්ස්ෆර්ඩ් සහ කේම්බ්‍රිජ් විශ්ව විද්‍යාල සීමා වී තිබුණේ සහ ඒවායේ වැඩි වශයෙන් ඉගැන්වුනේ මානව විද්‍යාවත්, සම්භාව්‍ය සාහිත්‍ය සහ දර්ශනවාදයයි. ඒ හැරුණු විට ක්‍රීඩාවට ද එම විශ්ව විද්‍යාල තුළ විශේෂ ස්ථානයක් හිමිව තිබිණ. පෞඪ ඓතිහාසික ගොඩනැගිලිවලින් සමන්විත වූ මෙම ඉහළ පෙළේ විශ්ව විද්‍යාල වලට තමන්ගේ ම දේවස්ථාන සහ ගංගාවන් තිබිණ. ඒවායේ සංස්කෘතිය විදහා දක්වන බෝට්ටු තරඟ සහ ඓතිහාසික චාරිත්‍ර වැනි සම්ප්‍රදායන්ගෙන් යුතු විය. මෙම විශ්ව විද්‍යාල තුළින් බිහිකරනු ලබන්නේ බ්‍රිතාන්‍ය සහ එහි යටත් විජිත රාජ්‍යයන් පාලනය කිරීම සඳහා පාලක පන්තියකි. වරප්‍රසාද ලත් පන්තියේ බලකොටු ලෙස පැවතුන ඔක්ස්ෆර්ඩ් සහ කේම්බ්‍රිජ් සමඟ සසඳා බලන කල ලන්ඩන් ස්කූල් ඔෆ් ඉකොනොමික්ස් හැඳින්විය හැකි වූයේ ඉහළ පාන්තික නොවන නිහතමානි විශ්ව විද්‍යාලයක් වශයෙනි. එය කාලය සමඟ වෙනස්වන අවශ්‍යතාවයන් පිළිබිඹු කරන නාගරික ආයතනක් විය. මේ වන විට සමාජය සහ ආර්ථිකය ද සංකීර්ණත්වයට කාර්මීකරණයට භාජනය වෙමින් පැවතිණ. ආණ්ඩු කිරීම සඳහා සම්භාව්‍ය අධ්‍යාපන තුළින් මහත්වරු බිහිකිරීම පමණක් තව දුරටත් නොසෑහිණ. රට රටවල ආණ්ඩු විසින් වඩ වඩා සංකීර්ණ දේශපාලන සහ ආර්ථික ආයතන පිහිටවමින් තිබිණ. මේවායේ සේවය සඳහා විශේෂඥ දැනුම ඇත්තන් එහි ප්‍රායෝගික දැනුමින් හෙබි උගතුන්ගේ අවශ්‍යතාව දිනෙන් දින ඉහළ යමින් පැවතුණි. සමාජ විද්‍යාවේ පුරෝගාමියෙකු වූ මැක්ස් මෙබල් අධ්‍යාපනය කෙරෙහි වූ මේ වෙනස් ප්‍රවේශයන් හි ගැටුම පිළිබඳ ව මෙසේ සටහන් කළේය. ''සම්ප්‍රදායික ප්‍රවේශය ලෙසින් හැඳින්වුනු පළමු වැන්නෙහි අභිමතාර්ථය මනුෂ්‍යයාගේ ජීවන ලීලාවේ ගුණාත්මක භාවය වන අතර, මෙය ශිෂ්ඨතම සංවර්ධනය ලෙස සැලකුනු අතර, දෙවන ප්‍රවේශය විශේෂඥතාවය අරමුණු කරගත් විශේෂ දැනුමක් ලබා දීමකි'' (Weber, 1948, p.243).

අධ්‍යාපන ක්‍රමයන්ගේ මෙම වෙනස්වීම 1930 සහ 40 දශක වලදී වඩා ස්ථිර වූ අතර, යටත් විජිත රාජ්‍යන් හි ද පැතිර ගියේය. එන්. යූ. ලන්ඩන් ස්කූල් ඔෆ් ඉකොනොමික්ස් සිට ආපසු සිය රට පැමිණියේ විශේෂඥ දැනුම ලබාදෙන අධ්‍යාපනයේ ''ප්‍රතිමූර්තියක් '' ලෙසිනි. රාජ්‍ය සේවයේ නියුතුව සිටි පැරණි අධ්‍යාපන ක්‍රමය තුළින් බිහි කළ වැඩිහිටි පරපුරේ නිලධාරීන්ගේ නොරිස්සුමට එන්. යූ. ලක්වීමට මෙය හේතුවක් විය. එන්. යූ. ජයවර්ධන සතුව තිබූ අධ්‍යාපන සුදුසුකම් පළපුරුද්ද සහ ආකල්ප වලින් යුතු පුද්ගලයෙකුට ලන්ඩන් ස්කූල් ඔෆ් ඉකොනොමික්ස් ආයතනය කදිම තෝතැන්නක් විය. ප්‍රතිපත්ති මූලික අධ්‍යාපන ක්‍රමයක් එහි පැවති අතර, සමාජ විද්‍යාව, දේශපාලන විද්‍යාව, ව්‍යාපාර, වාණිජ සහ සංඛ්‍යා ලේඛනය වැනි තවත් විෂයන්ගෙන් යුත් නව පාඨමාලා පැවතිණ. මෙබඳු විෂයන් පැරණි විශ්ව විද්‍යාවල ඉගැන්වුනේ නැත. ''පරිපූර්ණ ආයතනයක්''ලෙස එහි විශේෂ ආකර්ෂණයක් පැවතිණ. උදෑසන විශ්ව විද්‍යාලයට ඇතුල්වන ශිෂ්‍යයෝ ඉන් පිටත්ව ගියේ රාත්‍රියේ දී ය. දේශපාලන, ඉගැන්වීම් සහ සාකච්ඡා වලට අමතරව පුස්තකාලය ආපන ශාලාව පරිහරණය කිරීමේ අවස්ථාව ඔවුන් තිබිණ. දිවා ආහාර වේලාවෙන් පසු පැවති නර්තනයන්ට සහභාගි වීමට මෙන්ම ශිෂ්‍ය සමිති කටයුතු වල යෙදීමේ අවස්ථාවද එහි විය. එපමණක් නොව ඔවුන් සඳහා ආරාධිත දේශකයින්ගේ දේශනා ද සංවිධානය විය. මෙම දේශකයින් කොපමණ පරාසයක විහිදුනේදැයි කිවහොත් බ්‍රිතාන්‍ය සහ එහි යටත් විජිත වල සිට එන දේශපාලනඥයින් පමණක් නොව, නිදහස් අරඹයා අරගල කරන්නවුන් ද ඒ අතර වේ.

ලන්ඩන් ස්කූල් ඔෆ් ඉකොනොමික්ස් පරිශ්‍රයෙන් පිටතදී ශිෂ්‍යයෝ ලන්ඩන් නැමැති මහ නගරයේ කොටස් කරුවෝ වූහ. ලන්ඩන් වූ කලී සමාජ දේශපාලන සහ සංස්කෘතිකමය ආකර්ශනයන්ගෙන් මෙන්ම අවකර්ශනයන්ගෙන් ද ගහන වූවක් විය. ලන්ඩන් ස්කූල් ඔෆ් ඉකොනොමික්ස් ආයතනය ලන්ඩන් නගර මධ්‍යයේ පිහිටි අතර ඓතිහාසික ස්මාරකයන් මෙන්ම වැදගත් ආයතන ද එයට නුදුරින් පිහිටියේ ය. ආයතනයෙන් පිටවී විනාඩි කිහිපයක් තුළ බ්‍රිතාන්‍ය ගුවන් විදුලි ආයතනයට, බ්‍රිතාන්‍ය මහ බැංකුව සහ වාණිජ බැංකු වලට (Threadneedle Street) පුවත්පත්




**107. ලන්ඩන් ස්කූල් ඔෆ් ඉකොනොමික්ස් විශ්ව විද්‍යාලයේ මහාචාර්ය ආනෝල්ඩ් ප්ලනට් ගේ සිතුවමකට අනුව එහි පදක්කම හා ආදර්ශ පාඨය**

ආයතන වලට (Fleet Street) අධිකරණ සංකීර්ණයට, බ්‍රිතාන්‍ය කෞතුකාගාරයට, ට්‍රැෆල්ගා චතුරශ්‍රයට, බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුවට මෙන්ම බටහිර අන්තයේ පිහිටි නෘත්‍ය ශාලාවලට ද ලගා විය හැකිය. එපමණක් නොව, සොහෝ හි විවිධ ජාතීන්ගේ ආපන ශාලා ද චාරිංක්‍රොස් වීදියේ අතිවිශිෂ්ඨ පොත් සාප්පු විශේෂයෙන් (Foyles) ද ලන්ඩන් ස්කූල් ඔෆ් ඉකොනොමික්ස් ශිෂ්‍යයින්ට අත ළඟම වාගේ පිහිටියේය.

විවිධ පුද්ගලයින් විසින් කරනු ලැබූ ප්‍රධානයන් සහ අන්තිම කැමති පත්‍රවලින් උරුම කරනු ලැබූ ප්‍රදානයන්ගේ ආධාරය ලබමින් ලන්ඩන් ස්කූල් ඔෆ් ඉකොනොමික්ස් ආයතනය ක්‍රමයෙන් සංවර්ධනය විය. ලන්ඩන් විශ්ව විද්‍යාලයේම කොටසක් ලෙස වැඩුන ද මෙම ආයතනය එයටම ආවේනික වූ අනන්‍යතාවයක් පවත්වාගෙන යාමට සමත්විය. ලන්ඩන් ස්කූල් ඔෆ් ඉකොනොමික්ස් හි ආදර්ශ පාඨය වූයේ ''හේතුව දැන ගැනීමට'' යන්න වන අතර, එහි සංකේතය බීමරයකු වන අතර බීමරයා ගුල් හාරන්නෙකි. ඒවන විට ලන්ඩන් ස්කූල් ඔෆ් ඉකොනොමික්ස් ආයතනය හැඳින්වෙමින් තිබුනේ ''The School'' යන නමිනි. නව ආර්ථික විද්‍යා සහ දේශපාලන විද්‍යා විෂයයන් ඉගැන්වීම සඳහා ආචාර්යවරුන් ආකර්ෂණය කරගැනීමට ලන්ඩන් ස්කූල් ඔෆ් ඉකොනොමික්ස් ආයතනය සමත් විය. මේ හරහා ප්‍රසිද්ධ සහ පෙරලිකාර චරිත ආයතනය තුළට ඇතුල් වීම වඩ වඩාත් ශිෂ්‍යයින් ආකර්ෂනය කර ගැනීමට හේතු සාධක විය. 1920-1937 දක්වා කාලය තුළ ලන්ඩන් ස්කූල් ඔෆ් ඉකොනොමික්ස් ආයතනයේ අධ්‍යක්ෂකධූරය හෙබවූයේ විලියම් බෙවරිජ් සාමිවරයා විසිනි. දෙවන ලෝක යුද්ධයෙන් අනතුරුව බ්‍රිතාන්‍යය සුභ සාධක රාජ්‍යයක් බවට පත් කිරීමට පාදක වූ බෙවරිජ් වාර්තාව සකස් කරනු ලැබුයේ ඔහු විසිනි. 1974-1984 කාලය තුළ ආයතනයේ අධ්‍යක්ෂක ධූරය දැරූයේ රැල්ෆ් ඩැරෙන්ඩෝෆ්ය. ආයතනයේ නිල ඉතිහාසය සටහන් වල කතුවරයා වූ ඩැරෙන්ඩෝෆ් එහි සටහන් කරන්නේ සමාජ විද්‍යාවන් ලන්ඩන් ස්කූල් ඔෆ් ඉකොනොමික්ස් ආයතනය විසින් සිදුකරන ලද ''නව සොයා ගැනීමක්'' නොවුවද යුරෝපයේ අන් කිසිම විශ්ව විද්‍යාලයක් සිදු නොකල අයුරින් ඒ සියල්ල එක් ස්ථාන රැස්කොටගෙන ඒවායේ විවිධත්වය රැක ගනිමින් පූර්ණත්වයට පත් කිරීමට සමත් වූ බවයි (Dahrendorf, 1995, p.vii).

ලෝකයේ විවිධ රටවලින් ඇදී ආ විද්වතුන්ගෙන් සමන්විත වීම ලන්ඩන් ස්කූල් ඔෆ් ඉකොනොමික්ස් විශ්ව විද්‍යාලයේ විවිධත්වයට දායක වූ එක් හේතුවක් විය. එය ''ආයතනයේ ප්‍රධාන ශක්තීන්ගෙ න් එකක් වූ අතර සිය ගණනාවක් සිසුවන්ගේ මෙන්ම තරුණ ආචාර්යවරුන්ගේ ද බුද්ධිමය නිම්වළලු පුළුල් කිරීමට සාධක විය (ibid, p.223). 1930 ගණන්වලදී යුරෝපයේ පැතිර ගිය පැසිස්ට්වාදයෙන් ගැලවීම සඳහා පලා ආ උගතුන් විසින් විශ්ව විද්‍යාලයට නව ජීවයක් ලබා දෙනු ලැබිණි (ibid, p.296). ආර්ථික විද්‍යාඥ හැරී ජොන්සන් පවසන අන්දමට විශ්ව විද්‍යාලයේ

ප්‍රධානතම ලක්ෂණය වනුයේ එය බ්‍රිතාන්‍ය තුළ පිහිටි ආර්ථික විද්‍යාව ඉගැන්වීමේ සම පර්යේෂණ කටයුතු වල යෙදෙන සැබෑ ජාත්‍යන්තර මධ්‍යස්ථානය වීම බවයි.

> එය සමතුලිතතාවය රැක ගැනීම සඳහා සහ විවිධත්වය සහතික කිරීම සඳහා විදේශීය ආචාර්යවරුන් සහ විදේශීය ශිෂ්‍යයින් කිහිප දෙනෙකුට අවස්ථාව ලබාදෙන තවත් එක් බ්‍රිතාන්‍ය විශ්වවිද්‍යාලයක් නොවේ. එය ලෝකයේ කොතැනක හෝ පවතින බුද්ධිමය සම්පත් සමග සබඳතාවය පවත්වා ගෙන යාමට උත්සාහ කරන ගෝලීය විශ්ව විද්‍යාලයකි. එපමණකුදු නොව ඔවුන්ගේ උපත කොතැන සිදුවූයේද යන්න නොසලතා තුණාත්මක බවින් යුත් ශිෂ්‍යයින්ට අවස්ථාව ලබාදෙන ආයතනයකි. (Johnson quoted in Dahrendorf , p.223)

ලෝකයේ සතර දිගින් දීප්තිමත් ශිෂ්‍යයින් ආකර්ෂණය කර ගනු ලබන කාන්දමක් ලෙස ලන්ඩන් ස්කූල් ඔෆ් ඉකොනොමික්ස් විශ්ව විද්‍යාලයේ ආර්ථික විද්‍යා අංශය 1920 සහ 1930 දශක වලදී ප්‍රසිද්ධියක් දිනාගෙන තිබිණ (Dahrendorf, p.215). අප්‍රිකාවෙන්, පෙරදිගින් පමණක් නොව උතුරු දකුණු ඇමරිකානු රටවලින් ඇදී ආ ශිෂ්‍යයෝ විශාල සංඛ්‍යාවක් එවක එහි ඉගෙනුම ලැබූහ. මොවුන්ගෙන් වැඩි දෙනෙක් පසු කළෙක සිය රටවල ප්‍රමුඛ පෙළේ දේශපාලනඥයින්, රාජ්‍ය නිලධාරීන්, රාජ්‍ය තාන්ත්‍රිකයන් සහ විශ්ව විද්‍යාල ආචාර්ය වරුන් බවට පත් වූ බවට සාධක තිබේ. ක්‍රිෂ්ණා මෙනන්, එන්. එම්. පෙරේරා, ආර්.එන්. හක්සාර්, ඩොරින් වික්‍රමසිංහ සහ නේරු 1930 ගණන් වල ලන්ඩන් ස්කූල් ඔෆ් ඉකොනොමික්ස් විශ්ව විද්‍යාලයේ අධ්‍යාපනය ලැබුවන් ය. සිය අධ්‍යාපන කාලය තුළ මෙවන් ශිෂ්‍යයින් විශාල සංඛ්‍යාවක් එන්. යූ. ට හමුවූවාට සැක නැත. මන්ද පසු කලෙක ඉන්දියානු රාජ්‍යතාන්ත්‍රිකයෙකු බවට පත්වූ නේරු සටහන් කොට තිබුනේ තම නිවෙස් වලින් බැහැරව, මුල් ඉදිරි ගිය තත්ත්වයට පත්ව මිතුරන් ද රහිතව හුන් වැඩි දෙනෙක් දේශීය ශිෂ්‍යයින් ද එක්කර ගනිමින් කණ්ඩායම් සාදා ගැනීමේ ප්‍රවණතාවක් පැවති බවයි (ibid, p.190).




108. ලන්ඩන් ස්කූල් ඔෆ් ඉකොනොමික්ස් විශ්ව විද්‍යාලයේ ආචාර්ය මණ්ඩලය හා සිසුන්, 1924

ජාතීන් වශයෙන් සහ සමාජ පන්තීන් වශයෙන් ගත් කල ලන්ඩන් ස්කූල් ඔෆ් ඉකොනොමික්ස් විශ්ව විද්‍යාලය තුළ සැළකිය යුතු විවිධත්වයක් පැවතිණ. මෙය කාලයක් තිස්සේ පැවත ආ අනෙකුත් විශ්ව විද්‍යාලවල පැවති තත්වයට බෙහෙවින් වෙනස් වූවකි. නේරු ට අනුව විශ්ව විද්‍යාලය තුළ පැවතියේ අමුතුම ආකාරයේ අධ්‍යාපන රටාවක් වන අතර, අධ්‍යාපනයෙන් බැහැරට සිත ඇදෙන ආකර්ශනයන්ගෙන් තොර විය (ibid, p.185). විශ්ව විද්‍යාලයෙන් අධ්‍යාපන ලැබූ කිංස්ලි මාර්ටින් (කර්තෘ නිව් ස්ටේට්ස්මන්) පවසා ඇත්තේ එය නිදහස් සාකච්ඡා වලට ද එකිනෙකා සමග ගැටසෙන විට ජාතීන්ට ද අව්‍යාජ ඉගෙනීම ද මවුබිමක් ම වූ බවයි (ibid, p.187). ඩැරෙන්ඩෝෆ් ට අනුව විශ්ව විද්‍යාලයේ බිහි වුවෝ සැම විටම දොසින් තොර වූ සර්ව සම්පූර්ණ පුද්ගලයෝ නොවූහ. මන්ද, ඒ තුළට ආකර්ශනය වූයේ දැඩි වෙහෙස මහන්සියෙන් හා කැපවීමෙන්, කිසියම් ඉලක්කයක් කරා යොමුව කටයුතු කරන බුද්ධිමතුන්ය (ibid, p.191).

අනෙකුත් ප්‍රධාන පෙළේ විශ්ව විද්‍යාලවල මෙන් නොව දුප්පත් සිසුන් බොහෝ දෙනෙක් විශ්ව විද්‍යාලය තුළ ඉගෙනුම ලැබූ බවත්, තවත් සමහරු දිවා කාලයේ රැකියා කරන අතරතුර සැඳෑ කාලයේ පාඨමාලා හැදෑරූ බවත්, ඔහු තව දුරටත් සඳහන් කරයි. ඩැරෙන්ඩෝෆ් සිය සටහනෙහි පවසන්නේ සමහර සිසුන් ඉතා දැඩි දරිද්‍රතාවයෙන් පෙලුන බවයි. මැන්චෙස්ටර් ප්‍රදේශයේ කම්කරු පවුලකින් විශ්ව විද්‍යාලයට ආ නෙල් මැක්ග්‍රෙගර් ආර්ථික අවපාත අවධියේදී තේ, බනිස් සහ පිලිස්සූ ආර්තාපල් හැර වෙනත් ආහාරයක් මිලදී ගන්නට ආර්ථික ශක්තියක් නොමැතිව සිටියදී පවා සිය උපාධිය අවසන් කල බව සඳහන් කිරීම පවා වේදනා සහගත බව ඩැරේන්ඩෝෆ් කියා සිටී (ibid, p.299). සිය ජීවිතයේ එක් කලෙක සමාන අත්දැකීම් වලට මුහුණ දුන් එන්. යූ. ට බාධාවන් සමග සටන් කරමින් සිය අධ්‍යාපන කටයුතු ඉදිරියට ගෙන යන්නට අරගලයක යෙදුනු මෙබඳු සිසුන්ගේ ගැටළු දයාවෙන් වටහා ගන්නට හැකියාව තිබූ බව සැක නැත. ලන්ඩන් නුවර එක් කෙලවරක සිට අනෙක් කෙලවරට ඇවිද යද්දී දක්නට ලැබුනු පොහොසත් කම සහ දුප්පත් කම අතර වූ උග්‍ර පරතරය තමා ද කම්පනයට පත් කළ බව වසර ගණනාවකට පසුව පැවති පටිගත කල සාකච්ඡාවකදී ඔහු සඳහන් කොට තිබේ. එන්. යූ. උගත් කාලයට ආසන්න කාලයක සිටි ශිෂ්‍යයෙකු ආර්ථික විද්‍යාඥයෝ තමන් ඉතා සුවිශේෂි පිරිසකැයි සිතා සිටියහ. ලෝකයේ කෙසේ වෙතත් අවම වශයෙන් විශ්ව විද්‍යාලයවත් තමන් කැරකැවෙතැයි ඔවුන්ගේ කල්පනාව විය (ibid, p.298). සමහර විශිෂ්ඨ ආචාර්ය වරුනට ''වර්ග කරන්නා'' වැනි නම් යොදා තිබිණ (ibid, p.297).

**ආර්ථික විද්‍යා අංශය :**

විශ්ව විද්‍යාලය අරඹනු ලැබුයේ සමාජ ප්‍රජාතන්ත්‍රවාදී දර්ශනයක් පාදක කොටගෙනය. නමුත් 1930 ගණන් වලදී ආර්ථික විද්‍යාව අතින් දකුණ ට නැඹුරු වූ අතර, දේශපාලන විද්‍යාව වම ට නැඹුරු විය. පැරණි කේම්බ්‍රිජ් විශ්ව විද්‍යාල ආකර්ශනය කර ගත්තේ වමට නැඹුරුවක් ඇති වූ ආර්ථික විද්‍යානඥයින් ය. නිදහස් වෙළඳ පොල සහ කිනිසියානු මොඩලය පිළිබඳව විශ්ව විද්‍යාල දෙක අතර මත ගැටුම් ඇති විය (ibid, p.219). විශ්ව විද්‍යාල දෙක අතර දෙවන මත භේදය ඇති වූයේ 1929 ආර්ථික අවපාතයට විසඳුම් සෙවිය හැක්කේ කෙසේද යන්න පිළිබඳවය. මෙය සිදු කළ යුත්තේ අවධමනය තුළින් එසේත් නැතහොත් රජයේ වියදම් ඉහළ දැමීමෙන් දැයි ඔවුහු තර්ක කළහ. ආර්ථික අවපාතය සමය තුළ ලන්ඩන් නුවර ජීවත් වූ එන්. යූ. ඒ පිළිබඳව රචනාවක් ද කර තිබිණ. ඔහු අනිවාර්යෙන්ම විශ්ව විද්‍යාල දෙක අතර හුවමාරු වූ විවාදයන් කියවන්නට ඇත. එමෙන්ම ඔහු සහතික වශයෙන්ම ඇදී යන්නට ඇත්තේ විශ්ව විද්‍යාලය දැරූ මතවාදය දෙසටය. මෙම වාද විවාද උද්ගත වූ 1930 ගණන් වලදී ආර්ථික විද්‍ය ඉතිහාසයේ කලහකාරි සමය ලෙස හැඳින් විණ (ibid, p.217). සාකච්ඡා වූ ගැටළු ඉතා පුළුල් වූ අතර, ක්‍රමවේදයන්, න්‍යායන්, ප්‍රතිපත්ති, මතවාදයන් මෙන්ම සාමාන්‍ය ජන ජීවිතයට ආර්ථික විද්‍යාව බලපාන ආකාරය වැනි බොහෝ දෑ මේවා තුල අන්තර්ගත ව තිබිණ (ibid, p.218). දේශපාලනය ලන්ඩන් ස්කූල් ඔෆ් ඉකොනොමික්ස් විශ්ව විද්‍යාලය තුළ නිබඳව රැඳී පැවති හෙයින් මේ තර්ක විතර්ක වල දේශපාලන බෙදීමක් ද දක්නට ලැබිණ. කේන්සියානු මැදිහත් වීම සහ සමාජවාදය එවකට පුළුල්ව පැතිර පැවති මතවාදයන් විය. ලයනල් රොබින්ස් සහ ෆ්‍රෙඩ්රික් වොන් හේක් එක්ව මෙම මතවාදයන්ට එරෙහිව විශ්ව විද්‍යාලය තුළ සාම්ප්‍රදායික ලිබරල්වාදී ආරක්ෂක පවුරු ඉදි කළහ. ලයනල් රොබින්ස් ආර්ථික විද්‍යා අංශයේ ප්‍රධානියා විය. ඔහු උපත ලැබූයේ 1898 ලන්ඩන් නුවරට නුදුරින් වූ ගම්මානයකය. උයන් පල්ලකු වූ රොබින්ස් ගේ පියා තද බැප්ටිස්ට් ආගමිකයෙකු වූ අතර, ලිබරල්

ක්‍රියාකාරිකයෙකු විය. ලඟම පිහිටි පාසලට යාම සඳහා රොබින්ස් ට සැතපුම් 5 ක් උදේ හවා බයිසිකල් පදින්නට සිදු විය. ශිෂ්‍යයෙකු වශයෙන් 1920 දී ලන්ඩන් ස්කූල් ඔෆ් ඉකොනොමික්ස් විශ්ව විද්‍යාලයට ඇතුල් වූ ඔහුට පසුව එහි ආචාර්ය මණ්ඩලයට එක්වීමේ අවස්ථාව එළඹිණ. 1929 දී ඔහු එහිම ආර්ථික විද්‍යා මහාචාර්යවරයෙකු බවට පත් විය (Darendorf, p.214). විශිෂ්ඨ ගුරුවරයෙකු වූ ලයනල් රොබින්ස් වඩාත් ප්‍රසිද්ධියට පත් වූයේ ආර්ථික විද්‍යා න්‍යායන් සම්බන්ධයෙන් ඔහු පැවැත්වූ සම්මන්ත්‍රණ වලට ය (ibid). වෙනත් පාඨමාලාවන් හදාරණ ශිෂ්‍යයින් ද මෙම සම්මන්ත්‍රණ වලට සහභාගී වූහ. රොබින්ස්ගේ මෙම චිර ප්‍රසිද්ධ සම්මන්ත්‍රණයකට සහභාගී නොවූයෙක් වී නම් ඔහු විශ්ව විද්‍යාලය තුළ අධ්‍යාපන නොලැබුවෙකැයි සිතන තරමට මේවා ජනප්‍රිය වී තිබිණ (S. B. D. de Silva, 2007, පෞද්ගලික ලිපි ගොනු).



109. ලයනල් රොබින්ස් (ලන්ඩන් ස්කූල් ඔෆ් ඉකොනොමික්ස් විශ්ව විද්‍යාලයේ ආර්ථික විද්‍යා අංශ ප්‍රධානී)

ෆ්‍රෙඩ්රිච් වොන් හෙයික් ලන්ඩන් ස්කූල් ඔෆ් ඉකොනොමික්ස් විශ්ව විද්‍යාලයට සම්බන්ධ වනුයේ 1931 දී ලියෝනල් රොබින්ස් විසින් කරන ලද ආරාධනයක් මතය. ඔහු විසින් ඉදිරිපත් කරන ලද දර්ශනවාදයන් සහ න්‍යායයන් ආර්ථික විද්‍යාව සහ ආර්ථික විද්‍යා ප්‍රතිපත්ති යන විෂය මත ඉතාමත්ම වැදගත් බලපෑමක් එල්ල කරන්නට සමත් විය. හේක්, ඒ වන විට බිඳ වැටී තිබූ ඔස්ට්‍රෝ-හංගේරියානු අධිරාජ්‍යයේ සිට එංගලන්තයට පැමිණියෙක් වූ අතර, ඔස්ට්‍රියානු ආර්ථික විද්‍යා පාසලට අයත් වූයෙක් විය. හේක් ගේ මතයන් මුල් කාලයේ දී මුල් පෙළේ ආර්ථික විද්‍යාඥයන්ගේ සරදමට ලක්විය. නමුත් 1980 ගණන් වලදී හේක් ගේ මතවාදයන් පිළිගැනීමට ලක් වන්නට වීම, දශක පහකට පසු එනම් 1974 ෆ්‍රෙඩ්රිච් වොන් හේක් ආර්ථික විද්‍යාව පිළිබඳ නොබෙල් සම්මානයෙන් පුදනු ලැබිණ. ඔහු වඩාත් ප්‍රසිද්ධියට පත් වූයේ මධ්‍යගත සැළසුම් සකස් කිරීමේ අනතුරු සාකච්ඡා කළ *The Road to Serfdom* නමැති කෘතිය රචනා කිරීමෙනි (1944). ඔහුගේ පවුලේ සාමාජිකයෝ බොහෝ දෙනෙක් ජීව විද්‍යාඥයෝ වූහ. දර්ශන වාදියෙකු වූ ලුඩ්විග් විට්ටෙජින්ස්ටෙයින් ඔහුගේ සමීප ඥාතියෙකු විය. වඩාත් සාධාරණ සමාජයක් බිහි කරන්නේ කෙසේද? යන දැවෙන ගැටළුවට විසඳුමක් සෙවිය යුතුය යන අදහස හේක් තුළට කාවැදුනේ තරුණ හමුදා බටයෙකු වශයෙන් පළමුවන ලෝක සංග්‍රාම යුධ වදිමින් සිටිය දීය.



110. ෆ්‍රෙඩ්රික් වොන් හේක්

කෙසේ වුවද ඔස්ට්‍රියානු ජාතිකයෙකු වූ ඔහුට කෙලින්ම අත්විඳින්නට සිදු වූයේ, පළමුවන ලෝක සංග්‍රාමයෙන් අනතුරුව සිය රට තුළ සිදුවූ අධි උද්ධමන තත්වයටය. එහි පවත්නා අනතුර ඔහුට හොඳින් වැටහින. ආර්ථිකයට රාජ්‍ය මැදිහත් වීම පිළිබඳව හේක් බැලුවේ සැක සහිතවය. පුද්ගල නිදහස වැඩි දියුණු කිරීමට මෙන්ම ඉල්ලුම සහ සැපයුම න්‍යාමයනය කිරීමට හොඳම ක්‍රමය ලෙස හේක් විශ්වාස කලේ විවෘත වෙළඳ පොල ක්‍රමයයි. අදිසි හස්තය, සංගවාගත් හස්තයකට වඩා හොඳයැයි



111. ජෝන් මෙයොනර්ඩ් කේන්ස්



112. පුස්තකාලය ද පිහිටා ඇති ලන්ඩන් ස්කූල් ඔෆ් ඉකොනොමික්ස් විශ්ව විද්‍යාල ගොඩනැගිලි සැලසුම් චිත්‍රය

ඇමරිකානු ආර්ථික විද්‍යාඥ ලැරි ස්මර්ස් විසින් හේක් ගේ මෙම අදහස වසර ගණනාවකට පසු සංක්ෂිප්ත කොට දක්වා තිබිණි (ibid, p.132). කෙන්සියන් මැදිහත්වීමේ සහ වෙනත් මධ්‍යගත ප්‍රවේශයන්ගේ හේක් දුටු ප්‍රධාන දුර්වලකමක් වේ. එනම් එක් ක්ෂේත්‍රයක සිට සැලසුම් කරන්නවුන්ට එම සැලසුම් ඒ ඒ ස්ථානයට ගැලපෙන ලෙස සකස් කරන්නට අවශ්‍ය වෙළඳ පොළ තොරතුරු නොමැති වීමයි. කෙන්සියන් මැදිහත්වීම ඇතුළු අනෙකුත් මධ්‍යගත ප්‍රවේශයන්ගේ නැගී ඒම පිළිබඳව හේක් වඩ වඩාත් තැතිගත්තේය. කේම්බ්‍රිජ් සහ ලන්ඩන් ස්කූල් ඔෆ් ඉකොනොමික්ස් විශ්ව විද්‍යාල අතර ඇතුලු ප්‍රසිද්ධ කේන්ස්-හේක් විවාද, සුභ සාධක රාජ්‍ය සහ වෙළඳ පොල විසින් පාලනය කරනු ලබන ආර්ථිකය යන සංකල්ප වල සුදුසු නුසුදුසු බව සාකච්ඡා කිරීමේදී අද පවා බලපෑම් ඇති කරයි. නූතන ආර්ථික විද්‍යාව කෙරෙහි විශ්ව විද්‍යාලය විසින් ඇති කරන ලද බලපෑම්, නිදහස් වෙළඳපොල ආර්ථික විද්‍යාවා පිළිබඳ නූතන අදහස් වලට පදනම වී ඇත. මෙම බලපෑම මුළු මහත් ලොව පුරා පැතිර ගියේය.

**ව්‍යාපාර පරිපාලනය :**

විශ්ව විද්‍යාලයේ පැවති පාඨමාලා බොහොමයක් මූලික වශයෙන් අධ්‍යයන පාඨමාලා විය. නමුත් ව්‍යාපාර සහ වාණිජ විෂයයන් ගේ ප්‍රායෝගිත ස්වභාවය පිළිබඳව අවබෝධයක් ලබාදෙන පාඨමාලා කිහිපයක් ද පැවතින. 1936 දී එන්. යූ. ජයවර්ධන විසින් තෝරාගන්නා ලද්දේ මින් එකක් වූ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ වූ විශේෂ පාඨමාලාවයි. විශ්ව විද්‍යාලයේ ව්‍යාපාර පරිපාලන අංශය අරඹන ලද්දේ 1931 වර්ෂයේදීය. මූලික වශයෙන් මෙය හාවඩ් ව්‍යාපාර පාසැලේ වැඩසටහන් වලට අනුව ස්ථාපනය කෙරිනි. හාවඩ් සහ ලන්ඩන් ස්කූල් ඔෆ් ඉකොනොමික්ස් විශ්ව විද්‍යාල දෙකම සාමාන්‍යයෙන් සාම්ප්‍රදායික බවින් අඩු ප්‍රායෝගික දැනුම ලබාදීම සඳහා වැඩි අවස්ථාවක් දෙන ක්‍රියා මාර්ග අනුගමනය කළහ. ව්‍යාපාර පරිපාලන පාඨමාලාවට අධ්‍යයන චාරිකාද බ්‍රිතාන්‍ය සමාගම් තුළ මෙන්ම රාජ්‍ය ආයතන සහ එවැනි වෙනත් ආයතන වල පුහුණු කාල සීමාද, ඉහල පෙළේ ව්‍යාපාරිකයින් විසින් මෙහෙයවනු ලැබූ සාකච්ඡාද ඇතුලත් විය.

විශ්ව විද්‍යාලයේ ව්‍යාපාර පරිපාලන පාඨමාලාව එවකට බ්‍රිතාන්‍යයේ තිබූ ඒ ආකාරයේ එකම පාඨමාලාව විය. පසු කලෙක බිහිවූ ව්‍යාපාර පරිපාලන ශාස්ත්‍රපති (MBA) උපාධියේ පුරෝගාමියා වූයේ ද මෙම පාඨමාලාවයි. පාඨමාලාවා හැදෑරීම සඳහා වසරකට තෝරාගනු ලැබූයේ සිසුන් 20 ක් පමණක් වූ අතර, ඇතුලුවීම සඳහා දැඩි තරඟකාරීත්වයක් පැවතිනි. (එන්. යූ. ජයවර්ධන පෞද්ගලික ලිපිගොනු) අතිවිශාල පරාසයක විහිදුනු විෂයන් විශාල සංඛ්‍යාවක් පාඨමාලාවෙහි ඇතුලත් විය. එපමණක් නොව කර්මාන්ත ශාලා නැරඹීමට යාමද පාඨමාලාවෙහි එක් අත්‍යවශ්‍ය අංගයක් විය.




113. බ්‍රිතාන්‍ය යුද සමයේ පෝස්ටරයක්

ඊට අමතරව ව්‍යාපාර පරිපාලනය සහ ආර්ථික ප්‍රතිපත්ති දේශනවලට සහභාගී වීමට ද ශිෂ්‍යයන්ට සිදුවිය. පාඨමාලාව සති 29 ක් පුරා විහිදුනු පූර්ණ කාලීන දිවා පාඨමාලාවකි. (ව්‍යාපාර පරිපාලන අංශයේ පත්‍රිකා 1939-40, p.6) ව්‍යාපාර සංවිධානය, කළමණාකාරණ, කර්මාන්තශාලා පරිපාලනය වැනි කරුණු හැදෑරීම සඳහා ගමන් කර්මාන්ත ශාලා ගනණාවක සංචාරය කල බව එන්. යූ. සිය වාර්තාවල සඳහන් කොට ඇත. ෆෝඩ් මෝටර් සමාගම, හැරඩ්ස්, ලියොන්ස් සහ මෙටල් බොක්ස් මේ අතරින් කිහිපයකි. යටත් විජිත කාර්යාලය, විදේශ වෙළඳ දෙපාර්තමේන්තුව යටත් විජිත අධිරාජ්‍යයේ වෙළඳ මණ්ඩලය වැනි රාජ්‍ය ආයතන ද ඔහුගේ අධ්‍යයන චාරිකා වලට අයත් විය. ව්‍යාපාර පරිපාලන හදාරන සිසුනට විශ්ව විද්‍යාලයේ සියලු පහසුකම් භාවිත කිරීමේ අවස්ථාව ලැබින. මේ අතර පුස්තකාල පහසුකම් මෙන්ම ශිෂ්‍ය සංගමයේ සාමාජිකත්වයද විය. පීඨය ව්‍යාපාර පරිපාලනයේ ප්‍රවීන විද්වතුන්ගෙන් සමන්විත වූ අතර ප්‍රධානියා වූයේ වාණිජ්‍ය සහ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ මහාචාර්යවරයෙකු වූ ආනෝල්ඩ් ප්ලාන්ට්ය. ප්ලාන්ට් ආර්ථික විද්‍යා විෂයයෙහි අතිවිශිෂ්ඨ ගුරුවරයෙක් විය (Dahrendorf, p.205). ඒ හැරුණු විට විශිෂ්ඨ ගනයේ ගුරුවරු රැසක් එහි සේවය කළහ. මෙහි පෙර සඳහන් කල ලියෝනල් රොබින්ස් සහ ෆෙඩ්රිච් වොන් හේක් හැරුණු විට එෆ්. ඩබ්. පයිෂ්, වේරා ඇන්ස්ටේ, ඒ.එම්. කෲ-සොන්ඩර්ස් මහාචාර්ය ආර්.එච්. ටව්නේ ද මේ ගුරුවරු අතර වූහ. මහාචාර්ය ටව්නේ තමන් විසින් රචනා කරන ලද (Religion and the Rise of Capitalism) නම් සම්භාව්‍ය කෘතිය තුළින් ඔහු වඩා ප්‍රසිද්ධියට පත්ව සිටියේය.




114. වානිජ අංශ මහාචාර්ය ආර්නෝල්ඩ් ප්ලනට් ගේ රේඛා සිතුවමක්

අනෙකුත් ගුරුවරුන් අතර දේශපාලන විද්‍යාව ඉගැන්වූ හැරල්ඩ් ලැස්කි ද ජාත්‍යන්තර ඉතිහාසය ඉගැන්වූ ඒ. ටී. ටොයින්බී ද සමාජ විද්‍යා ආචාර්යවරයෙකු වූ මොරිස් ජින්ස්බර්ග් ද මානව විද්‍යාව ඉගැන්වූ බී මැලිනොව්ස්කි ද තවත්, සමාජ විද්‍යා ආචාර්යවරයෙකු වූ කාල් මැන්හෙයිම් ද විය. ඉංග්‍රිසි නීතිය ඉගැන්වූයේ අයිවර් ජෙනිංන්ස් ය. (ලන්ඩන් ස්කූල් ඔෆ් ඉකොනොමික්ස් දින දර්ශනය 1938-39, pp.24-29) මේ අතරින් අයිවර් ජෙනිංන්ස් සම්බන්ධයෙන් විශේෂ සඳහනක් කළ යුතුය. මන්ද ඔහු පසු කාලීනව ශ්‍රී ලංකාවේ විශ්ව විද්‍යාල පද්ධතිය සහ ව්‍යවස්ථාව සම්බන්ධයෙන් සුවිශේෂී කාර්යභාරයක් ඉටුකල පුද්ගලයෙකු බවට පත්වන හෙයිනි. එවකට පැවැති සිලෝන් යුනිවර්සිටි කොලීජියේ අධිපතියා ලෙස කටයුතු කිරීමට අයිවර් ජෙනිංන්ස් ශ්‍රී ලංකාවට පැමිණෙන්නේ දෙවන ලෝක සංග්‍රාමය ඇවිලෙමින් තිබූ 1941 වර්ෂයේදීය. අනතුරුව කොළඹ සහ පේරාදෙණිය විශ්ව විද්‍යාල ඇරඹීමේ ගෞරවයට ජෙනිංන්ස්ට හිමිවේ. ශ්‍රීමත් ඔලිවර් ගුණතිලකගේ නීති උපදේශකයා වශයෙන් ද කටයුතු කල ජෙනිංන්ස් නිදහස් ශ්‍රී ලංකාව සඳහා සොල්බරි ව්‍යවස්ථාව සම්පාදනය කිරීමේ කාර්යයෙහි දී මහඟු මෙහෙයක් ඉටු කළේය.




115. බ්‍රිතාන්‍ය යුද සමයේ පෝස්ටරයක්

විශ්ව විද්‍යාලයේ එවකට තරුණ ආචාර්යවරුන්ව සිටි ආර්. ජී. ඩී. ඇලන් (සංඛ්‍යානය) ආර්. ඩබ්. ෆ්රේත් සහ එම්. ෆෝර්ටීස් (මානව විද්‍යාව) ඩඩ්ලි ස්ටෑම්ප් (භූගෝලය) සහ එච් ෆයිනර් (රාජ්‍ය පාරිපාලනය) පසු කලෙක තම ක්ෂේත්‍රයන්හි කැපී පෙනෙන චරිත බවට පත්වූහ.

විශ්ව විද්‍යාලයේ ගතකල කාලය තුළ ආර්ථික න්‍යායයන් කෙරෙහි එන්. යූ. දැක්වූ උනන්දුව වඩාත් තීව්‍ර විය. විශිෂ්ඨ ආර්ථික විද්‍යාඥයින්ගේ සමාජ විද්‍යාඥයින් දේශනයන්ට සහ සම්මන්ත්‍රණයන්ට සහභාගී වීම මෙන්ම ආර්ථික විද්‍යා න්‍යාය සහ ප්‍රතිපත්ති පිළිබඳ වූ විවාද මෙයට බෙහෙවින් උපකාරී විය. ඒ අතරම වෙනත් රටවලින් පැමිණ සිටි ශිෂ්‍යයන් තුළින් සිය අත්දැකීම් වඩාත් පුළුල් කරගන්නට ද එන්. යූ. ක්‍රියා කළේය. මානව ශාස්ත්‍රයන් පිළිබඳව රචිත පොත් 750,000 ක් පමණ විශ්ව විද්‍යාල පුස්තකාලය සතුවිය. (Pamphlet of the Dept of Business Administration, 1939-40, p.23) ශාන්ත ඇලෝසියස් විද්‍යාලයේ පුස්තකාලයේ සහ කියැවීමේ කාමරයේ පහස ලැබූ කුඩා වියේ සිටම පොත පතට මහත් අභිරුචියක් දැක් වූ එන්. යූ. ට දැනීම් සම්භාරයක් අඩංගු විශාල පොත් සංඛ්‍යාවක් පරිශීලනය කරන්නට ලැබීම අති විශාල ප්‍රීතියක් ලබා දුන්නට සැක නැත.

මින් පෙරද සඳහන් කල පරිදි සමහර විට එන්. යූ. ට තම ජීවිතයේ දැඩි නිදහසක් භුක්ති විඳින්නට ලැබුණු ප්‍රථම අවස්ථාව ලන්ඩන් හි අධ්‍යාපනය ලැබූ කාලය විය හැක. ඔහුගේ ලිපි ලේඛන වලින් පෙනී යනුයේ අධ්‍යාපන කටයුතු වැඩි දියුණු කර ගැනීම සඳහා සිය කාලය උපරිම ලෙස යොදා ගන්නා අතරම සංචාරය සඳහා ද කාලය මිඩංගු කිරීමට ඔහු පසුබට නොවූ බවයි. නිවාඩු කාලයේ දී කොන්වෙල් ප්‍රදේශයේ සංචාරය කළ එන්. යූ. ගිම්හාන නිවාඩු අතර තුර ස්විට්සර්ලන්තය බලා ගියේය. නමුත් යුරෝපය තුල එවකට උද්ගත වෙමින් පැවති තත්ත්වය හේතුකොටගෙන ඔහුගේ ස්විට්සර්ලන්ත සංචාරය හදිසියේම නිමවිය.

යුරෝපය පුරා පැසිස්ට්වාදය නැගී ඒම හේතුවෙන් යුද්ධය අත ලගම පැමිණෙන බව දැනෙමින් පැවතින. ලන්ඩන් නගරය තුළ දේශපාලන අවිනිශ්චිත බවකින් වැසී ගියේය. 1939 සැප්තැම්බර් මාසයේදී නාසි ජර්මනිය ට එරෙහිව යුද්ධ ප්‍රකාශ කිරීමෙන් පසු තත්වය වඩාත් නරක අතට හැරිණ. ආරක්ෂාකාරී ක්‍රියා පිළිවෙතක් වශයෙන් ලන්ඩන් ස්කූල් ඔෆ් ඉකොනොමික්ස් විශ්ව විද්‍යාලය තාවකාලිකව කේම්බ්‍රිජ් ප්‍රදේශයට ගෙන යාමට බලධාරීහු ක්‍රියා කළහ. 1939 වර්ෂය තුළ ලන්ඩන් නගරයට බෝම්බ හෙලීමක් හෝ සටන් ඇවිලීමක් හෝ නොවූවත් විදේශීය ශිෂ්‍යයෝ බොහොමයක් සිය රටවල් බලා ආපසු යාමට සූදානම් වූයේ යුද්ධය ඇවිලී ගියහොත් තමන් අතරමං වේ යැයි බියෙනි. මෙම අවදානමට මුහුණ දෙමින් කේම්බ්‍රිජ් හි පිහිටි ලන්ඩන් ස්කූල් ඔෆ් ඉකොනොමික්ස් මණ්ඩපයේ දිගටම රැඳී 1939/40 අධ්‍යයන වාරය නිම කිරීමට එන්. යූ. තීරණය කළේය. යටත් විජිත කාර්යාලය මුලදී එන්. යූ. ගේ මෙම තීරණයට විරුද්ධත්වයක් නොදැක්වූවත් 1939 ඔක්තෝම්බර් මාසයේ දී හදිසියේ ම විශ්ව විද්‍යාලය වෙත ලිපියක් යවමින් පැවසුයේ එන්. යූ. හැකි වහාම සිය රට බලා ආපසු යා යුතු බවයි. විශ්ව විද්‍යාලයට ලිපිය ලැබෙන විට එන්. යූ. ස්විට්සර්ලන්තයේ සංචාරය කරමින් සිටි හෙයින් එක්වරම ආපසු ලන්ඩන් පැමිණීම අපහසු විය. ප්‍රංශය හරහා පැමිණීම සඳහා වීසා ලබා ගැනීමේ දුෂ්කරතාවක් ඇතිවීම මීට හේතුවයි. කෙසේ වුවද 1939 දෙසැම්බර් මාසය වන විට ශ්‍රී ලංකාව ට ආපසු පැමිණෙන්නට ඔහුට හැකි විය.

**පවුලේ සාමාජිකයෝ යළි එක්වෙති**

එන්. යූ. අධ්‍යාපනය සඳහා ලන්ඩන් ස්කූල් ඔෆ් ඉකොනොමික්ස් විශ්ව විද්‍යාලයට යනවිට ලාල් සහ නිමල් පුතුන් දෙදෙනාගේ වයස් පිළිවෙලින් අවුරුදු 4 ක් සහ 2 ක් විය. ඔහු ලන්ඩන් නුවර සිටි කාලය අතර තුර ඔහුගේ බිරිඳ ගර්ට්රෑඩ් පුතුන් දෙදෙනා ද ඔවුන් රැක බලාගත් කාන්තාව ද සමග එතෙක් පදිංචිව සිටි ලුනාවේ නිවස අතහැර කොළඹ පදිංචියට පැමිණියාය. කොල්ලුපිටියේ පිහිටි ''කිලර්නි'' නම් නවාතැන් පොළ ඔවුන්ගේ කොළඹ නිවහන විය. ලාල් පාසැල්යාම ඇරඹුවේ මේ කාලයේ දී වූ අතර, ඔහුගේ මුල්ම පාසල සාන්ත ක්ලෙයාර් විද්‍යාලය වුව ද එය සාමාන්‍යයෙන් හැඳින්වූනේ ''මාෂල් මෙනෙවියගේ පාසැල'' යනුවෙනි. මන්ද ඒ වන විට එහි විදුහල්පතිධූරය දැරූයේ රූත් මාෂල් මෙනෙවියයි. දරුවන්ට ක්‍රීඩා කිරීම සඳහා ඔංචිල්ලා සහ වෙනත් පහසුකම් තිබූ එවක වික්ටෝරියා පාක් නමින් හැඳින්වුනු විහාරමහාදේවි උද්‍යානයට සැන්දෑ කාලයේදී දරුවන් රැගෙන යාම ගර්ට්රෑඩ් ගේ සිරිත විය. එන්. යූ. ගේ සහෝදරිය වූ රොස්ලින්ඩ් ගර්ට්රෑඩ් සහ දරුවන් දැක බලා ගැනීමට කොල්ලුපිටියට පැමිණ

අතර පසළොස්වක පොහොය ආසන්න වූ විට රත්මලානේ පිහිටි රොස්ලින්ඩ් ගේ නිවෙසට යාම ගර්ට්රූඩ් පුරුද්දක් වශයෙන් කල දෙයකි. එහි සිටි රොස්ලින්ඩ්ගේ දියණිය වූ චන්ද්‍රානිත් සමඟ සිල් සමාදන් වන්නට යාම මෙම ගමනේ අරමුණයි. එංගලන්තයේ සිට ඒන්. යූ. ආපසු පැමිණීමෙන් අනතුරු ඔහුගේ වෘත්තීය ජීවිතයේ ඉහළ නැගීමත් සමඟ පොලිස් උද්‍යාන පාරේ නිවසක් කුලියට ගත් ඒන්. යූ. ජයවර්ධන පවුලේ සියලුම සාමාජිකයෝ එහි පදිංචියට ගියහ.

තරුණ මවකට කුඩා පුතුන් දෙදෙනෙකු සමඟ තනිව ජීවත් වීම පහසු කරුණක් වූවා විය නොහැකිය. මෙම කාල පරිච්ඡේදය සිහිපත් කරමින් ඒන්. යූ. වසර ගණනකට පසු මෙසේ ලියා තිබින. ''ලන්ඩන් ස්කූල් ඔෆ් ඉකොනොමික්ස් විශ්ව විද්‍යාලයේ අධ්‍යාපනය ලබමින් මා ලන්ඩනයේ ගත කල එම කාලයේ දී මගේ පවුලේ අය මා අතින් කොතෙක් නොතකා හැර තිබුනේ දැයි මට අවබෝධයක් තිබුනේ නැත''(රෝෂාන් පීරිස්, Sunday Observer, 13 Dec. 1987).


116. නීලියා, ලාල් සහ නිමල්

මේ කාලයේදී ග්ර්ට්රූඩ්ට තුබූ විශාලතම පිහිට වූයේ තම සේවයේ සිටි ජේන් කොර්නේලියා අකලේ නම් කාන්තාවයි. ජේන් කෝර්නේලියා යුරේෂියානු ක්‍රිස්තියානි ලබ්ධිකයක වූවාය. සැමියාගේ මරණින් පසු ඇය ජයවර්ධන පවුලේ සේවයට පැමිනුනේ වැඩිමහල් දරුවා වූ ලාල් උපදින්නටත් කලිනි. එතැන් පටන් ඔවුන් සමගම සිටි ඇය ජයවර්ධන පවුලේ බාලම දරුවා වූ නීලියා විවාපත් වන තුරුම එහි රැඳී සිටියාය. 1880 දී පමණ උපන් ජේන් කොර්නේලියාගේ පියා යුරෝපීය වතු පාලකයෙකි. යුරෝපීය ජාතිකයිනට දාව ශ්‍රී ලාංකික කාන්තාවන්ට උපන් බොහෝ යුරෝපියානු අනාථයින් මෙන්ම ඇයද හැදී වැඩුනේ කතෝලික කන්‍යාරාමයක සෙවනෙනිය. ඇයට ඉංග්‍රිසි බස හොඳින් කතා කිරීමේ හැකියාව තිබින. ජයවර්ධන පවුලේ සේවයට පැමිණෙන්ට ප්‍රථමයෙන් ඇය වගිල්ව් නමින් වූ වතු ක්ෂේත්‍රයේ පවුලක හා තලාව ප්‍රදේශයේ පිහිටි අනාථ නිවසක ද සේවය කල බව පැවසේ. මෙම අනාථ නිවස පවත්වාගෙන යනු ලැබූයේ එවලින් කර්නි මෙනෙවිය නම් වූ මිෂනාරි කාන්තාවක විසිනි. ඊට අමතරව ජේන් කෝර්නේලියා අතලේ රෝහල් උපස්ථායිකාවක වශයෙන් ද සේවය කොට තිබිණ.

බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ සේවය කළ සිංහල නිලධාරියකු සමඟ විවාහ වී සිටි ඇය දියණියන් දෙදෙනෙකුගේ මවකි. ජයවර්ධන නිවස තුළ නැතිවම බැරි චරිතයක් බවට පත් වූ ඇය දරුවන් බලා ගැනීමෙහිදී අතිමහත් සේවයක් ඉටු කල අතර දරුවන් තුළ ඇය කෙරෙහි විශේෂ බැඳීමක් පැවතින. ජයවර්ධන පවුලේ දියණිය නීලියා පවසන අන්දමට ඒන්. යූ. ජයවර්ධන කෝප ගැන්වුනු විට ඔහුගේ කෝපය සංසිඳවීමේ හැකියාව තිබුනේ ජේන් කෝර්නේලියා අතලේට පමණකි. ජේන් කෝර්නේලියා අතලේ කිසිදිනෙක ජයවර්ධන පවුල හැර ගියේ නැත. වයස අනුවේදී එනම්

1970 දී ඇය මෙලොව හැර ගියේ නිමල් ජයවර්ධනගේ නිවසේ ජීවත්වෙමින් සිටියදී ය.

එන්. යූ. ජයවර්ධනගේ ජීවිතයේ වඩාත්ම වැදගත් අවධිය උදාවන්නේ එංගලන්තයේ ඉගෙනුම ලබා ආපසු පැමිණීමෙන් අනතුරුවය. ආර්ථික විද්‍යාඥයකු මෙන්ම පරිපාලකයකු වශයෙන් ඔහු සතුව පැවති හැකියාවන් වඩ වඩාත් හඳුනා ගැනෙනු ලබන්නේ ද උපරිම වශයෙන් ප්‍රයෝජනයට ගැනෙනු ලැබෙන්නේ ද යුධ සමයේ දී සහ යුද්ධය නිමාවීමෙන් පසුව එළැඹුනු කාලයේදීය.



117. නීලියා, නිමල්, අතලේ මහත්මිය (සේවිකාව) සහ ලාල් පසු කාලයක - අතලේ මහත්මියට පවුලේ වැදගත් ස්ථානයක් හිමිව තිබුණාය.